ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date 2024/05/29 |

පැමිණිලි පාර්ශවය :- පී.ඩබ්.නිහාල් සේනාරත්න මහතා,
පොලිස් ස්ථානය, අම්පාර.

වගඋත්තරකාර පාර්ශවය :-

01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ.

02. එච්.එම්.ජේ.පී.හේරත් මහතා,
පොලිස් අධිකාරී(1), අම්පාර.

03. සාමන්ත විජේසේකර මහතා,
අම්පාර කොට්ඨාසභාර පොලිස් අධිකාරී, අම්පාර.

04. ආයාස කරුණාරත්න මහතා,
හිටපු නියෝජ්‍ය පොලිස්පති, අම්පාර.

05. කමල් ජයනෙත්ති මහතා,
මූලස්ථාන පොලිස් පරීක්ෂක,
පොලිස් ස්ථානය, කල්මුණේ.

06. කපිල ජයසේකර මහතා,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නැගෙනහිර පළාත.

07. ජයන්ත රත්නායක මහතා,
අම්පාර කොට්ඨාසභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, අම්පාර.

08. පො.කො.83225 වීරසිංහ මහතා,
පොලිස් ස්ථානය,
සියඹලාණ්ඩුව.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.cor
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලි අංකය :- HRC/AM/15/21/S/EM

පැමිණිල්ල :-

පැමිණිලි පාර්ශවීය පො.සැ.පී.ඩබ්.නිහාල් සේනාරත්න මහතා විසින් උක්ත අංක දරණ පැමිණිල්ල මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, 2019.04.26 වන දින පැය 18 සිට පැය 6.00 දක්වා තමා සමඟ පො.කො.83225 වීරසිංහ හා පො.කො.51134 බණ්ඩාර යන නිළධාරීන් සයින්දමරුදු වොලිවේරියන් ගම්මානයට හැරෙන හන්දියේ ඉන්ධන පිරවුම්හල අසල රථ වාහන හා මාර්ග ආරක්ෂක රාජකාරියෙහි යෙදී සිටියදී එදින පැය 19 ට පමණ වොලිවේරියන් ගම්මානයේ අයි එස් ත්‍රස්තවාදීන් විසින් සිදු කිරීමට ගිය ත්‍රස්ත ප්‍රහාරය වැලැක්වීමට සහයෝගය දැක් වූ නිළධාරීන් හට වන්දි හා උසස්වීම් ලබා දීමේදී තමනට අසාධාරණයක් සිදු වූ බවයි.

උක්ත පැමිණිල්ල මගින් වැඩිදුරටත් දන්වා සිටින්නේ 2019.04.26 වන දින පැය 19 ට පමණ තමා රාජකාරී කරමින් සිටියදී පුද්ගලයින් තිදෙනකු පැමිණ සාජන් මහත්තයා කියා අමතා වොලිවේරියන් ගමේ නිවසක නාඳුනන පිරිසක් සිටින බවත් ඔවුන් පිට පළාතක සිට පැමිණ ඇති බවත් ඔවුන් අතැතිව අවි ඇති බවත් වෑන් රථයක් හා යතුරු පැදියක් ඇති බවත් පැවසූ පසුව වහාම ක්‍රියාත්මකවී අදාල ඉහල නිලධාරීන් දැනුවත් කර වෙඩි ශබ්දයන් ඇසෙන බැවින් රාජකාරී යෙදී සිටි සෙසු නිලධාරීන් දෙදෙනා හා තමා ඒ දෙසට ගමන් කරන විට තත්ත්වය බරපතල බව පෙනී ගිය බැවින් සාමාන්‍ය ජනතාවගේ ජීවිත බේරා ගැනීමට අවශ්‍ය පියවර ගත් බවත්, උසස් නිලධාරීන් දැනුවත් කිරීම මත පැමිණි එම පොලිසියේ උසස් නිළධාරීන්, යුධ හමුදාව, හා විශේෂ කාර්ය බලකා නිලධාරීන් එම ස්ථානයට ලඟා වීමට තැත් කිරීමේදී වෙඩි ප්‍රහාර එල්ල කර බෝම්බ පුපුරවාගෙන ත්‍රස්තවාදීන් දහසය (16) දෙනෙකු මියගිය බවත් ය.

මේ සඳහා තමාට හා තමා සමඟ රාජකාරියේ යෙදී සිටි අනෙක් නිලධාරීන් දෙදෙනාට පොලිස්පති තුමා විසින් ප්‍රශංසා හා මුදල් ත්‍යාග පිරිනමන ලද බවත්, නමුත් උසස්වීම ලබා දී ඇත්තේ තමා සමඟ එකම රාජකාරිය සිදු කළ පො.කො. 83225 වීරසිංහ නිළධාරියාට පමණක් බවත්, තමාට හා පො.සැ.බණ්ඩාර නිළධාරියාට උසස්වීම් නොලැබුණු බවත්, එකම රාජකාරියේ යෙදුනු තමාට හා අනෙක් නිළධාරියාට උසස්වීම් ලබා නොදීමෙන් වෙනස්කමකට භාජනය කර ඇති බවත් ය.

කණ්ඩායමටම ලැබිය යුතු උසස්වීම කණ්ඩායම් බාරව රාජකාරි සිදුකළ තමා සිටියදී කණ්ඩායමේ කිණිෂ්ඨම නිලධාරියාට ලබා දී ඇත්තේ තමාට හා අනෙක් නිලධාරියාට උසස්වීම් නොලැබෙන සේ අසත්‍ය වාර්තා සකස් කර 03 වන හා 04 වන වගඋත්තර නිලධාරීන් විසින් 01 වන වගඋත්තර පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් බවත් ඒ අනුව තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බවත් ය.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

01. මෙම පැමිණිල්ලට අදාලව 01 වන වගඋත්තරකාර පාර්ශවය වන පොලිස්පතිවරයා වෙනුවෙන් අධ්‍යක්ෂ පොලිස් නීති කොට්ඨාශය විසින් 2021.05. දින රහිත වාර්තාව ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ 2019.04.26 වන දින කල්මුණ පොලිස් වසමේ සයින්දමරුදු වොලිවේරියන් ගම්මානයේ නිවසක් තුල සැකකටයුතු පිරිසක් සිටින බවට සාමාන්‍ය වැසියන් දෙදෙනකු විසින් එදින ප්‍රධාන මාර්ගයේ රාජකාරියේ යෙදී සිටි පො.කො.83225 වීරසිංහ නිලධාරියාට දැනුම්දීම අනුව එම සිවිල් වැසියන් සමඟ සැක සහිත පුද්ගලයන් සිටින නිවස දෙසට වීරසිංහ නිලධාරියා ගමන් කල අවස්ථාවේ පිපුරුම් හඬක් සමඟ නිලධාරියා දෙසට වෙඩි ප්‍රහාර කීපයක් එල්ලවී ඇති බවත්, එම අවස්ථාවේ ඔහු ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කරමින් නැවත ප්‍රධාන මාර්ගය වෙත පැමිණ තමා සමඟ රාජකාරී කළ පො.සැ.7773 සේනාරත්න හා පො.කො.51134 බණ්ඩාර යන නිලධාරීන්ට සිද්ධිය දැනුම් දීමෙන් අනතුරුව උසස් නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ බවත් ය. ලද තොරතුර අනුව නොබියව හා නොපමාව ක්‍රියා කර සිදුවීමට තිබූ මහත් ව්‍යසන තත්ත්වයක් වලක්වා ගැනීමට කටයුතු කිරිම හේතුවෙන් පො.කො.83225 වීරසිංහ නිලධාරියා හට පොලිස් සැරයන් තනතුරට විශේෂ උසස්වීමක් සහ මුදලින් රුපියල් ලක්ෂ පහ (රු.500,000/-)ක මුදලක් ලබා දීමටත්, එම අවස්ථාවේදී ඔහු සමඟ රාජකාරි කළ පො.සැ.7773 සේනාරත්න හා පො.කො.51134 බණ්ඩාර යන නිලධාරීන්ට පොලිස්පති ප්‍රශංසාවක් හා මුදලින් රුපියල් ලක්ෂ පහ (රු.500,000/-) බැගින් ලබා දීමටත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර පළාත විසින් නිර්දේශ කර ඇති අතර, එම නිර්දේශය සලකා බලා පොලිස්පතිතුමා විසින් ඉහත පරිදි කටයුතු කර ඇති බව දන්වා ඇත.

02. මෙම පැමිණිල්ලට අදාලව 03 වන වගඋත්තර පාර්ශවීය එවකට කල්මුණ පොලිස් අධිකාරිව සේවය කළ එච්.එම්.ජේ.පී.හේරත් මහතා විසින් 2022.05.04 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ 2019.04.26 වන දින කල්මුණ සයින්දමරුදු ප්‍රදේශයේ පිහිටි වොලිවේරියන් ගම්මානයේ අයි එස් ත්‍රස්තවාදීන් විසින් සිදු කරන ලද ත්‍රස්ත ප්‍රහාරයට අදාලව එවකට කල්මුණ පොලිස් අධිකාරී වශයෙන් තමා විසින් විමර්ශන කටයුතු සිදුකර අදාල නිර්දේශයන් පොලිස් මූලස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කළ බවයි. 2019.04.26 වන දින සයින්දමරුදු ඉන්ධන පිරවුම්හල අසල රථ වාහන රාජකාරියේ යෙදී සිටි පො.සැ.7773 සේනාරත්න, පො.කො.83225 වීරසිංහ හා පො.කො.51134 බණ්ඩාර යන නිලධාරීන් වෙත වොලිවේරියන් ග්‍රාමය තුල පිහිටි නිවසක ගිනි අවි සහිතව පිරිසක් රැඳී සිටින බවට ලද තොරතුර අනුව එම සිදුවීම් ස්ථානයට පො.කො.83225 වීරසිංහ නිලධාරියා පමණක් ලද තොරතුරෙහි සත්‍ය අසත්‍යතාවය පරික්ෂා කිරීම සඳහා මීටර් 400 ක් පමණ ගම්මානය තුලට යමින් සිටියදී තොරතුරෙහි සඳහන් තැනැත්තෙකු විසින් ටී 56 ගිනි අවිය සහිතව වෙඩි තබමින් වීරසිංහ නිලධාරියා පලවා හැරීමට ක්‍රියා කර ඇති බවත්, වීරසිංහ නිලධාරියා පමණක් එම ස්ථානයට ගමන් කර ඇති බවත්, ඔහුගේ එම ක්‍රියාව තුලින් සිදුවීමට තිබූ බිහිසුණු තත්ත්වය හෙළිදරව්වීම හේතුවෙන් ආරක්ෂක අංශ අනතුරුව රාජකාරි සිදුකර ඇති බවද දන්වා ඇත. තවද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇති පො.සැ. සේනාරත්න නිලධාරියා තොරතුර ලැබෙන අවස්ථාවේ රථ වාහන කණ්ඩායමේ ප්‍රධානියා වශයෙන් කටයුතු කිරීම පමණක් සිදු කර ඇති බවට තොරතුරු අනාවරණය වූ අතර ඔහු කිසිඳු ප්‍රශංසාත්මක කටයුත්තක් සිදුකර නොමැති බවත් තම ජීවිත අවදානම නොතකා රාජකාරිය ඉටු කල වීරසිංහ නිලධාරියාට උසස්වීමක් ලබා දීම නිර්දේශ කරන ලද්දේ සිදුවීම පිළිබඳව පූර්ණ අවබෝධයක් තමා සතුව තිබූ බැවින් බවත් එකී වාර්තාව ප්‍රකාරව දන්වා ඇත.

03. 04 වන වගඋත්තරකාර පාර්ශවය වන සාමන්ත විජේසේකර මහතා විසින් පැමිණිල්ලට අදාල වාර්තාවක් අංක D/PNS/166/2022 හා 2022.01.09 දිනැති වාර්තාව මෙම කොමිෂන් සභාව වෙත යොමු කරමින්, පැමිණිලි පාර්ශවීය නිලධාරියා උසස්වීමක් ඉල්ලා පැමිණිලි කර ඇති බවත්, පැමිණිල්ලේ සඳහන් පාස්කු ප්‍රහාරය සිදු වන විට තමා අම්පාර කොට්ඨාශ භාර නිලධාරියා ලෙස රාජකාරි කළ බවත්, ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ වික්‍රමාන්විත රාජකාරියක් ඉටු කිරීම වෙනුවෙන් උසස්වීම් ලබාදීම සිදු කරනුයේ

පොලිස්පතිතුමා විසින් බවත් ඒ අනුව මෙම උසස්වීමද පොලිස්පතිවරයා විසින් ප්‍රධානය කර ඇති බවත් දන්වා ඇත.

04. 01 වන වගඋත්තර පාර්ශවීය පොලිස්පති වෙතින් අදාල ලේඛන ඉල්ලීමේදී 2023.02.20 දිනැතිව පොලිස් මානව හිමිකම් කොට්ඨාශයේ අධ්‍යක්ෂ විසින් අදාල සිදුවීමට අනුව පොලිස් නිළධාරින් හට උසස්වීම් ,ප්‍රශංසා සහ ත්‍යාග මුදල් ලබා දීමට දිස්ත්‍රික්කය භාර සහකාර පොලිස් අධිකාරී, කොට්ඨාශභාර නිලධාරී සහ නියෝජ්‍ය පොලිස්පති විසින් නිර්දේශ කර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර පළාත මගින් ලබා ගැනීමට කටයුතු කළ බවත් දන්වමින් එම ලේඛන ඉදිරිපත් කර ඇත.

05. අම්පාර කොට්යශභාර ජ්‍යෂ්ඨ පොලිස් අධිකාරී විසින් 2023.05.09 දිනැතිව ඉහත සිදුවීමට අදාල ලේඛන ඉදිරිපත් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු විසින් 2021.02.15 දින කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අනුව 2019.04.26 දින කල්මුණ සයින්දමුරුදු වොලිවේරියන් ගම්මානයේදී අයි එස් ත්‍රස්තවාදීන් විසින් සිදු කිරීමට ගිය ව්‍යසන තත්ත්වයන් වලක්වාලීමට කටයුතු කළ නිලධාරීන්ට විශේෂ උසස්වීම් ලබා දීමේදී තමන්ට එකී උසස්වීම් නොලැබීම සම්බන්ධව වගඋත්තරකරුවන්ට එරෙහිව මෙම පැමිණිල්ල ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිල්ලේ සඳහන් ආකාරයට ප්‍රස්තුත සිදුවීමට අදාලව සිවිල් පුද්ගලයන්ට හා නිලධාරීන්ට පොලිස්පතිවරයා විසින් ඇගයීමට ලක්කර උසස්වීම්, ප්‍රශංසා හා ත්‍යාග ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු අනාවරණය කරන්නේ 2019.04.26 දින සයින්දමරුදු වොලිවේරියන් ගම්මානයේ දී ඇතිවූ සිද්ධිය සම්බන්ධයෙන් තමන් සමග එකම රාජකාරිය සිදු කළ පො.කො. 51134 බණ්ඩාර, පො.කො. 83225 වීරසිංහ යන තිදෙනාගෙන් පො.කො. වීරසිංහ නිලධාරියාට පමණක් උසස්වීම ලබාදිමෙන් තමන් වෙනස්කමකට භාජනය කර ඇති බවයි.

පැමිණිල්ලට අදාලව වාර්තා සපයන පොලිස් මානව හිමිකම් කොට්ඨාසය, පොලිස්පතිවරයා ඇතුලුව වගඋත්තරකාර පාර්ශවය අනාවරණය කරන්නේ පොලිස් අධිකාරී, නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යන අයවලුන්ගේ නිර්දේශ මත අදාල නිලධාරීන්ට

උසස්වීම් හා ත්‍යාග ලබාදී ඇති බවයි. විශේෂයෙන්ම වගඋත්තරකරුවන් අවධාරණය කරන්නේ සයින්දමරුදූ සිද්ධියේ දී, සිදුවීමට ගිය විශාල විනාශය වැළැක්වීමට පො.කො. 83225 වීරසිංහ නිලධාරියා පමණක් මුලින්ම නොපමාව කටයුතු කිරීම අනාවරණය වූ නිසා ඔහුට උසස්වීම් ප්‍රදානය කළ බවයි. ඒ බැව් තහවුරු කිරීම සඳහා 2019.05.04 දිනැති මූලස්ථාන පොලිස් පරීක්ෂක කමල් ජයනෙත්ති මහතා කල්මුණ විසින් පොලිස් අධිකාරී, කල්මුණ වෙත යවන ලද වාර්තාව, එමෙන්ම කල්මුණ පොලිස් අධිකාරී එච්.එම්.ඒ.පී. හේරත් මහතා විසින් අම්පාර කොට්ඨාස භාර පොලිස් අධිකාරී වෙත යවන ලද වාර්තාව හා අම්පාර පොලිස් අධිකාරී සාමන්ත විජේසේකර මහතා විසින් අම්පාර නියෝජ්‍ය පොලිස්පති වෙත යවන ලද නිර්දේශ වාර්තාව හා අම්පාර නියෝජ්‍ය පොලිස්පති ආයාස කරුණාරත්න මහතා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර දිසාව වෙත යවන ලද නිර්දේශ වාර්තාව හා නැගෙනහිර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල ජයසේකර මහතා විසින් පොලිස්පති වරයා වෙත යවන ලද නිර්දේශ වාර්තාව ඉදිරිපත් කරයි.

මූලස්ථාන පොලිස් පරීක්ෂක 2019.05.14 වාර්තාවේ දැක්වෙන්නේ 2019.04.26 දින සයින්දමරුදූ වොලිවේරියන් ග්‍රාමයේ සිදුවූ සිද්ධියේ දී පැමිණිලිකාර පො.සැ. සේනාරත්න, පො.කො. වීරසිංහ හා පො.කො. බණ්ඩාර යන නිලධාරීන් රථවාහන අංශයේ රාජකාරි සඳහා යොදවා සිටිය දී එදින 18.30 පැයට පො.කො. වීරසිංහ නිලධාරියාට ගම්වාසීන් විසින් සැක සහිත පුද්ගලයන් පිළිබඳව තොරතුරු දැන්වීමෙන් අනතුරුව පළමුව සැකකරුවන් රැඳී සිටි ස්ථානය දක්වා වීරසිංහ නිලධාරියා ගොස් ඇති බවයි. ඒ අනුව කල්මුණ පොලිස් අධිකාරී එච්.එම්.ඒ.පී.හේරත් මහතා විසින් සයින්දමරුදූ සිද්ධියේ දී වීරසිංහ නිලධාරියා ප්‍රථමව සිද්ධිය වූ දිසාවට ගමන් කර ඇති බැවින් එම නිර්භීත ක්‍රියාව ඇගයීමට පො.කො. වීරසිංහ නිලධාරියාට උසස්වීමක් හා මුදලින් රුපියල් ලක්ෂ පහ (රු.500,000/-)ක ත්‍යාගයක් ලබාදීම සුදුසු බවටත්, එකී වීරසිංහ නිලධාරියාට සහය දැක්වීම වෙනුවෙන් පැමිණිලිකරුට හා පො.කො. බණ්ඩාර නිලධාරියාට රුපියල් ලක්ෂ පහ (රු.500,000/-) බැගින් ත්‍යාග දීම සුදුසු බවටත් නිර්දේශ කර ඇති බව නිරීක්ෂණය වේ.

ඉන් අනතුරුව නියෝජ්‍ය පොලිස්පති ආයාස කරුණාරත්න, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල ජයසේකර යන අයවලුන් විසින් ද එකී නිර්දේශ ඉදිරිපත් කරමින් පො.කො. 83225 වීරසිංහ නිලධාරියා සැකකටයුතු පුද්ගලයින් සිටින දිශාවට ප්‍රථමව ගමන් කර ඇති බව දක්වමින් ඔහුව උසස්වීම සඳහා නිර්දේශ කර ඇති බව නිරීක්ෂණය වේ.

පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා විසින් 2020.02.28 දිනැතිව නිකුත් කරන ලද C/RTM-1831 මගින් සයින්දමරුදූ වොලිවේරියන් ග්‍රාමයේ සිද්ධිය සම්බන්ධයෙන් මුල් තොරතුරු

ලැබීමෙන් පසුව ක්ෂණිකව නොබියව ක්‍රියාත්මක වීමෙන් ව්‍යසනය වැළැක්වීමට කටයුතු කළ බව දක්වමින් පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පො.කො. 83225 වීරසිංහ නිලධාරියාට පො.සැ. තනතුරට උසස්වීම් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් කරුණු අනුව සයින්දමරුදු වොලිවේරියන් ග්‍රාමයේ සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් උසස්වීම් ලැබූ පො.කො.83225 වීරසිංහ නිලධාරියා හට මුල් තොරතුරු ලැබීම, ක්ෂණිකව ක්‍රියාකිරීම, නොබියව ක්‍රියාකිරීම, පුද්ගලයන් සිටින ප්‍රදේශයට ප්‍රථමව ගමන් කිරීම යන කරුණු නිවැරදි ලෙස අනාවරණය කරගත් මූලාශ්‍රයක් හෝ පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බවත්, එවැන්නක් මුල් වරට අනාවරණය කර ඇත්තේ 2019.05.04 දිනැති 06 වන වගඋත්තරකාර පාර්ශවය වන කල්මුණ පොලිසියේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. කමල් ජයනෙත්ති පොලිස් නිලධාරියා විසින් පොලිස් අධිකාරී වෙත යවන ලද වාර්තාව මගින් බවත්, ඉන්පසුව පොලිස්පති දක්වාම එම තත්ත්වය වාර්තා කිරීම සිදුකර ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිල්ලේ සඳහන් පරිදි පැමිණිලිකාර පො.සැ. 7773 සේනාරත්න යන අය පො.කො. 51134 බණ්ඩාර හා පො.කො. 83225 වීරසිංහ යන නිලධාරීන් සමඟ රථවාහන රාජකාරි සඳහා 2019.04.26 දින සවස 5.30 පිටව ගොස් ඇති අතර, කණ්ඩායම්භාර නිලධාරියා වශයෙන් පැමිණිලිකරු ක්‍රියාකර ඇති බව පොලිස් උධෘත අනුව අනාවරණය වේ. ඊට අදාල සටහන් ඇතුළත් කිරීමේදී 2019.04.27 වන දින පැය 19.20 පැමිණීම සටහන් කරමින් පැමිණිලිකරු විසින් පො.කො. බණ්ඩාර, පො.කො. වීරසිංහ යන අය සමඟ රාජකාරියේ නියුක්ත වී සිටිය දී තමන් අසලට පැමිණි පුද්ගලයින් තිදෙනෙකු විසින් සැකකටයුතු පුද්ගලයන් පිළිබඳව දැන්වූ බව සටහන් කර ඇත. පැමිණිලිකරුගේ විභාග සටහන් වල ද 2019.04.30 වන දින ඒ බැව් සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ .

සයින්දමරුදු වොලිවේරියන් ග්‍රාමයේ සැකකටයුතු පුද්ගලයන් සිටින බවට පැමිණිලිකරු වෙත තොරතුරු ලබාදුන් කබීර් මොහොමඩ් රිස්වි යන අය දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් අලියාර් මන්සූර් මොහොමඩ් හා අහමඩ් මොහොමඩ් රිස්වාන් යන අයවලුන් සමඟ පැමිණ ප්‍රථමයෙන්ම පො.සැ. සේනාරත්න මහතාට සැකකටයුතු පුද්ගලයන් පිළිබඳව තොරතුරු ලබාදුන් බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇති පරිදි අදාළ තොරතුර ප්‍රථමයෙන්ම ලැබී ඇත්තේ ඔහු වෙත බව නිරීක්ෂණය වේ.

2022.03.20 දිනැතිව පො.කො. 51134 බණ්ඩාර යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදී ඇති අතර, ඔහු සඳහන් කරන්නේ 2019.04.26 දින පො.සැ. සේනාරත්න (පැමිණිලිකරු)

හා පො.කො. වීරසිංහ සමඟ සයින්දමරුදූ වොලිවේරියන් හංදියේ ඉන්ධන පිරවුම්හල අසළ තිදෙනාම රථවාහන රාජකාරිවල නියලුන බවත්, එම අවස්ථාවේ දී වීරසිංහ නිලධාරියා ඔහුගේ ජංගම දුරකතනයෙන් කෙනෙකු සමඟ කතාකරමින් සිටි බවත්, එම අවස්ථාවේ දී තමා අසලට පුද්ගලයකු පැමිණ සැකකටයුතු පුද්ගලයන් පිළිබඳව තොරතුරු ලබාදුන් බවත්, අනතුරුව තවත් තිදෙනෙකු පැමිණ "අපේ දරුවෝ බේරලා දෙන්න" කියා පැවසූ බවත්, ඉන්පසුව පැමිණිලිකාර පො.සැ. සේනාරත්න විසින් උසස් නිලධාරීන්ට තත්ත්වය දැනුම්දුන් බවත් ය. ඒ අනුව පො.කො. 51134 බණ්ඩාර යන අයගේ ඉහත ප්‍රකාශය අනුව උසස්වීම් සඳහා නිර්දේශ කළ හා උසස්වීම් ලැබූ වීරසිංහ නිලධාරියාට මුල් තොරතුරු ලැබීමක් හෝ ඔහු තනිවම ඉදිරියට යාමක් හෝ ක්ෂණිකව ක්‍රියාත්මකවීමක් හෝ පිළිබඳව තත්ත්වයක් නිරීක්ෂණය නොවේ.

2022.03.28 දින පො.කො. 83225 වීරසිංහ විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදී ඇත. එකී ප්‍රකාශයට අනුව ඔහු සඳහන් කරන්නේ, සයින්දමරුදූ වොලිවේරියන් ග්‍රාමයේ සිදුවූ සිද්ධිය සිදුවූ දින තමන් පැමිණිලිකරු වන පො.සැ. සේනාරත්න හා පො.කො. බණ්ඩාර සමඟ රාජකාරි කරමින් සිටිය දී තමන් ළඟට පැමිණි පුද්ගලයකු සැකකටයුතු පුද්ගලයින් පිළිබඳව දැනුම්දුන් බවත්, ඒ බව පො.සැ.සේනාරත්නට කියා සිටි බවත්, අනතුරුව පො.සැ.සේනාරත්න (පැමිණිලිකරු) විසින් උසස් නිලධාරීන්ට ඒ බැව් දන්වා සිටි බවත්, ඉන් අනතුරුව ඔහු සැකකටයුතු නිවස දෙසට ගිය බවත්, එහිදී වෙඩි ප්‍රහාරයක් ද එල්ලවූ බවත්, එම අවස්ථාවේ දී අනෙක් නිලධාරීන් දෙදෙනා ඒ අසල සිටියේද යන්න දුටුවේ නැති බවත්, එම ස්ථානයේ විශාල සෙනඟක් සිටි බවත්, ප්‍රකාශ කර ඇත. සැකකටයුතු නිවස දෙසට යන අවස්ථාවේ දී ඔහුගේ යතුරුපැදියේ තවත් පුද්ගලයකු ද ගමන් කළ බැව්, ඔහුගේ ප්‍රකාශය අනුව අනාවරණය වේ. එම ප්‍රකාශය අනුව පො.කො. 83225 වීරසිංහ නිලධාරියා සැකකටයුතු නිවස දෙසට තනිවම ගමන් කර නොමැති අතර, ඔහුගේ යතුරු පැදියේ තවත් පුද්ගලයකු ද ගමන් කර ඇති බව ඔහු ප්‍රකාශ කරයි. එම ස්ථානයේ විශාල සෙනඟක් සිටිය බවත්, අනෙක් නිලධාරීන් දෙදෙනා දුටුවේ නැති බවත් ප්‍රකාශ කරයි. මෙම නිලධාරියා සැකකටයුතු නිවස දෙසට තනිවම ගිය බවට හෝ ආ බවට හෝ විශේෂ සිදුවීමක් පිළිබඳව සටහනක් නොමැති බව ද නිරීක්ෂණය වේ. එහෙත් පැමිණිලිකරු විසින් යොදා ඇති 2019.04.26 හා 2019.04.27 දිනැති පිටවීමේ හා පැමිණීමේ සටහන් වල නිලධාරීන් තිදෙනාම සැක කටයුතු නිවස පිහිටි ස්ථානයට ගිය බවත්, එම අවස්ථාවේ දී වෙඩි ප්‍රහාරයක් එල්ල වූ බව ද දක්වා ඇත. තව ද පො.කො. 51134 බණ්ඩාර නිලධාරියාගේ ප්‍රකාශය තුළ ද දක්වා ඇත්තේ සැකකටයුතු නිවස දෙසට යන්නට පෙර වෙඩි තැබීම් හා පිපිරුම් ඇතිවූ බවයි. මෙම කරුණු අනුව පො.කො. 83225 වීරසිංහ නිලධාරියා සැකකටයුතු නිවස පිහිටි

ප්‍රදේශයට තනිවම ගමන් කළ බව හෝ ඔහු විසින් කරන ලද විශේෂ කාර්යයක් පිළිබඳව කිසිවක් අනාවරණය නොවන බව නිරීක්ෂණය වේ.

2022.05.04 දිනැතිව එවකට කල්මුණ පොලිස් අධිකාරි ලෙස කටයුතු කළ එච්.එම්.ජේ.පී. හේරත් මහතා විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති වාර්තාවේ දැක්වෙන්නේ පො.කො. වීරසිංහ නිලධාරියා, සයින්දමරුදු වොලිවේරියන් ග්‍රාමයේ ඇතිවූ සිද්ධියේ දී සැකකටයුතු තොරතුරු පරීක්ෂා කිරීම සඳහා ඔහු තනිවම මීටර් 400 ක දුරක් ගම්මානය තුළට ගොස් ඇති බවයි. එහෙත් එය තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් නොමැති බව අනාවරණය වන අතර, පො.කො. වීරසිංහ නිලධාරියා හෝ එවැනි ප්‍රකාශයක් සිදුකර ඇති බවක් අනාවරණය නොවේ. තව ද පොලිස් අධිකාරී හේරත් මහතා විසින් 2019.05.05 දිනැතිව පොලිස් අධිකාරි, අම්පාර වෙත යවා ඇති නිර්දේශ වාර්තාවේ වීරසිංහ නිලධාරියා පිළිබඳව හා ඔහු කළ කාර්ය පිළිබඳව පරස්පර කරුණු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වන අතර, විශේෂයෙන්ම වීරසිංහ නිලධාරියා ප්‍රථමයෙන් ක්‍රියාකර ඇති බවත්, ඔහු විසින් උසස් නිලධාරීන්ට සිද්ධිය දැන්වූ බවත්, එහි දැක්වේ. එය සෙසු නිලධාරීන්ගේ ප්‍රකාශ හා පොලිස් අධිකාරි විසින්ම ඉහත කොමිෂන් සභාවට ලබාදුන් වාර්තාවේ කරුණු වලට පරස්පර බව නිරීක්ෂණය වේ.

2019.04.26 වනදින සයින්දමරුදු වොලිවේරියන් ග්‍රාමයේ සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් සිවිල් වැසියන් තිදෙනෙකුට මුදලින් රුපියල් ලක්ෂ දහය (රු.1,000,000/-) බැගින් ත්‍යාග ප්‍රදානය කර ඇති අතර, අහමඩ් මොහොමඩ් රිස්වාන්, අලියාර් මන්සූර් මොහොමඩ් සාහීර්, අහමඩ් කබීර් මොහොමඩ් රිස්වි යන අය එසේ ත්‍යාග ලබා ඇත්තේ සැක කටයුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබාදී ව්‍යසනය වැළැක්වීමට සහය දැක්වීම වෙනුවෙනි. පැමිණිලිකාර පො.සැ. සේනාරත්න නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත කරන ලද මෙම පැමිණිල්ලේ දී ඔහු අවධාරණය කරන්නේ සිවිල් වැසියන් තිදෙනෙකු පැමිණ තමාට සැකකටයුතු පුද්ගලයන් පිළිබඳව තොරතුරු ලබාදුන් බවයි. පැමිණිල්ල සමඟ ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇත්තේ එම පුද්ගලයින් බව නිරීක්ෂණය වන අතර, ත්‍යාග ලබාගෙන ඇත්තේ ද එම පුද්ගලයින් විසිනි. ඒ අනුව පැමිණිලිකරුට සැකකටයුතු පුද්ගලයන් සම්බන්ධ තොරතුරු ලබාදුන් පුද්ගලයන් හා ත්‍යාග ලබාගත් පුද්ගලයන් එකම පිරිසක් බව නිරීක්ෂණය වන අතර, පො.කො. 51134 බණ්ඩාර හා පො.කො. 83225 වීරසිංහ යන අයවලුන්ට පළමුව තොරතුරු ලබාදුන් පුද්ගලයකු ඉදිරිපත් කර නැති අතර, ත්‍යාග ලාභියකු ද නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළ විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අනුව සයින්දමරුදු වොලිවේරියන් ග්‍රාමයේ සිද්ධිය සම්බන්ධයෙන් උසස්වීම ලැබූ පො.කො. 83225 වීරසිංහ

නිලධාරියාට ප්‍රථමයෙන් තොරතුරු ලැබීම, තනිවම මීටර් 400 ක් වොලිවේරියන් ග්‍රාමය තුළට ගමන් කිරීම, ක්ෂණිකව ක්‍රියාත්මක වීම, නොබියව, නිර්භීතව ක්‍රියාකිරීම ආදී කරුණු වලට පිළිගත හැකි පදනමක් නොමැති කරුණු බව අනාවරණය වේ. මෙම සිද්ධියේ දී රථවාහන නිලධාරීන් වශයෙන් ක්‍රියාකරන ලද පැමිණිලිකාර පො.සැ. 7773 සේනාරත්න, පො.කො. 51134 බණ්ඩාර, පො.කො. 83225 වීරසිංහ යන නිලධාරීන් අතරින් කෙනෙකු අනෙකාට වඩා සුවිශේෂී වික්‍රමාන්විතයක්, ක්‍රියාවක් සිදුකර ඇති බවක් අනාවරණය නොවන අතර, ඔවුන් තිදෙනාම එම අවස්ථාවේ උසස් නිලධාරීන්ට දන්වා වගකීම අනුව එකට ක්‍රියාකර ඇති බව අනාවරණය වේ. වීරසිංහ නිලධාරියා පළමුව ක්‍රියාකර ඇති බව වැරදි ලෙස සටහන් කර ඇත්තේ මෙහි හයවන වගඋත්තරකරු වශයෙන් නම්කර ඇති ප්‍ර.පො.ප. කමල් ජයනෙත්ති නිලධාරියා විසින් වන අතර, ඉන්පසුව පොලිස්පතිවරයා දක්වා එම තොරතුරු ඒ ආකාරයෙන්ම ගමන්කර ඇති නිසා එකම කාර්යක නිරත වූ නිලධාරීන්ගෙන් එක් නිලධාරියකුට පමණක් විශේෂ වරප්‍රසාද ලැබී ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම සයින්දමරුදූ වොලිවේරියන් ග්‍රාමයේ ඇතිවූ සිද්ධියේ දී පැමිණිලිකාර පො.සැ. සේනාරත්න, පො.කො. බණ්ඩාර, පො.කො. වීරසිංහ යන නිලධාරීන් රථවාහන රාජකාරි වල නිරතවී සිටිය දී මුහුණදුන් සිද්ධියකි. ඔවුන් ආසන්නයේ මීටර් 6, 7 ක් දුරින් රාජකාරි කළ බව ද ප්‍රකාශවල දැක්වේ. ඔවුන් අපරාධ විමර්ශන නිලධාරීන් නොවන අතර, එහෙත් අවස්ථාව පරිදි ඒ සඳහා යොමුවී සාමුහිකව ක්‍රියාකර ඇති අතර, පො.සැ. සේනාරත්න කණ්ඩායම්භාර නිලධාරියා වශයෙන් ද ක්‍රියාකර ඇති අතර, ඔහුගේ කණිෂ්ඨ නිලධාරියා සඳහා විශේෂ හේතුවක් නොමැතිව උසස්වීමක් ලබාදී ඇති බව අනාවරණය වේ. මේ සඳහා නිර්දේශ ලබාදුන් උසස් නිලධාරීන් පො.කො. වීරසිංහ නිලධාරියා තම යතුරු පැදියේ ඉදිරියෙන් ගිය බවටත්, පැමිණිලිකාර පො.සැ. සේනාරත්න හා පො.කො. බණ්ඩාර යන අය තවත් යතුරු පැදියක ඊට පසු පසින් ගමන් කර ඇති බව සඳහන් කරන අතර, ඒ අනුව ද පො.කො. වීරසිංහ නිලධාරියා පළවෙනියා කිරීමට කටයුතු කර ඇති බව අනාවරණය වේ. පැමිණිලිකරු සඳහන් කරන ආකාරයට මෙම සිද්ධියේ දී නිලධාරීන් අතින් යම් අතපසුවීමක් වරදක් වී තිබුනේ නම් ඒ සඳහා කණ්ඩායම් භාර නිලධාරියා වශයෙන් ඔහුට විශාල වගවීමකට යටත්වීමට සිදුවන බව පෙනේ. කෙසේ නමුත් එකම සිද්ධියේ දී සාමුහිකව තම ශක්ති ප්‍රමාණයෙන් කරන ලද කාර්යයේ දී පො.කො. වීරසිංහ නිලධාරියාට පමණක් උසස්වීම් ප්‍රදානය කිරීම හා පැමිණිලිකාර පො.සැ. සේනාරත්න හා පො.කො. බණ්ඩාර යන අයවලුන්ට උසස්වීම් ප්‍රදානය නොකිරීමෙන් පැමිණිලි පාර්ශවය වෙනස්කමට භාජනය කරමින් වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රියාකර ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකරු විසින් තමන්ට සිදුවූ අසාධාරණය සම්බන්ධව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත මෙන්ම උසස් පොලිස් නිලධාරීන්ට ද, ආරක්ෂක ලේකම් වෙත ද අභියාචනා කර ඇති අතර, ඒ අනුව සහනයක් ලැබී නොමැති බව පරීක්ෂණයේදී අනාවරණය වී ඇත.

**නිගමනය :-**

පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2021.02.15 වන දින ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අනුව කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු අනුව2019.04.26 දින කල්මුණ සයින්දමරුදු වොලිවේරියන් ග්‍රාමයේ සිදුවූ ප්‍රහාරය සම්බන්ධයෙන් සාමූහිකව රාජකාරි කළ නිලධාරීන්ගෙන් එක් නිලධාරියකු පමණක් විශේෂ කොට සැලකීම හා පැමිණිලිකරු හා ඊට සම්බන්ධ සෙසු නිලධාරියා පිළිබඳව නිසි ඇගයීමට ලක්නොවීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

පැමිණිලිකරුට සහන සැලසීම වස් පහත සඳහන් නිර්දේශ වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රියාත්මක කළ යුතුය.

01. පැමිණිලිකරු පැමිණිල්ලෙන් ඉල්ලා ඇති පරිදි පොලිස් සැරයන් තනතුරේ සිට ඊළඟ උසස්වීම වන උප පොලිස් පරික්ෂක තනතුර දක්වා උසස්වීම ලබාදිය යුතු අතර, එය 2019.04.26 දින සිට ක්‍රියාත්මක වන සේ ලබාදීමට කටයුතු කළ යුතුය.

02. පො.කො. 51134 බණ්ඩාර නිලධාරියා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැති නමුත්, ඔහු සම්බන්ධයෙන් ද සුදුසු සහන සැලසීමට පොලිස්පතිවරයා විසින් ක්‍රියා කිරීම සුදුසු ය.

2024.07.18 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යේෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත:-

1. අමාත්‍යතුමා,
   මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
   04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

2. සභාපති,
   පොලිස් කොමිෂන් සභාව, කොළඹ. - කරුණු දැනගැනීම සඳහා

3. අධ්‍යක්ෂ,
   මානව හිමිකම් කොට්ඨාසය,
   එන්.එම්.පෙරේරා මාවත,
   කොටා ටෙරස්, කොළඹ 08. - අදාළ නිලධාරීන්ගේ නව සේවා ස්ථාන වෙත නිර්දේශ යොමු කිරීම සඳහා